**ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

**-----------------------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 14 දින පාලක ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**-------**

**2.1 විසර්ජන ගිණුම**

**------------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**-----------------------------**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,161.79 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,981.53 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 180.26 ක් හෙවත් සියයට 8.34 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,045.32 | 1,038.52 | 6.80 | 0.65 |
| මූලධන | 1,116.47 | 943.01 | 173.46 | 15.54 |
| **එකතුව** | **2,161.79** | **1,981.53** | **180.26** | **8.34** |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා අංක 20.03.02.07 දරන ආදායම් සංකේතය වෙනුවෙන් රු.මිලියන 15,000.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 15,604.07ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු කළ ආදායම රු.මිලියන 604.07 කින් හෙවත් සියයට 4.03 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.07 | 15,000.00 | 15,604.07 | 604.07 | 4.03 |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 22601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 36.00 | 35.99 | 29.00 | 29.14 | 154.00 | 131.89 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0032/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂ එකතුව රු.මිලියන 6.39 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 10.86 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0082/000 | 0.10 |
| 6000/0000/00/0002/0112/000 | 0.11 |
| 6000/0000/00/0016/0059/000 | 10.47 |
| 6000/0000/00/0008/0071/000 | 0.18 |
| **එකතුව** | **10.86** |

## 2.5 විගණන නිරීක්ෂණය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (iii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.304,851 ක්වූ තැන්පතු 33 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 ආදායම් ගිණුම**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් 20.03.02.07 දරන ආදායම් සංකේතය යටතේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ මුදල් පොතට අනුව වීසා ආදායම හා පරිගණක පද්ධතියට අනුව වීසා ආදායමෙහි රු. 154,815 ක ශුද්ධ වෙනසක් පැවතුණි.

(ආ) ආදායම් මුදල් පොතට අනුව පුරවැසි අංශයේ ආදායම හා දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය අනුව පුරවැසි ආදායම අතර රු.50,000 ක ශුද්ධ වෙනසක් පැවතුණි.

(ඇ) වර්ෂයේදී වීසා රහිතව රැඳී සිටි අයගෙන් අයකර තිබුණු රු. 31,978,040 ක් මුදල් පොතේ සටහන් කර තිබුණත්, පරිගණක පද්ධතිය මඟින් එය තහවුරු වී නොතිබුණි.

(ඈ) 2016 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලයට අදාළ රු.39,345,806 ක් වූ (ETA Commission) ආදායම සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 22601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 834,692 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 12 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

## 3.6 අනුකූල නොවීම්

### 3.6.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94 (1) | - | වැය විෂයන් 04 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.45,732,804 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104 (3) | 7,400,000 | පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා ප්‍රමාද වන විට වහාම ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, වාහන අනතුරක් සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාව මාස 05 ක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 104 (4) | 7,400,000 | වාහන අනතුර සිදු වී මාස 6 ක පමණ කාල ප්‍රමාදයකින් පසුව පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට නිලධාරීන් පත්කර තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 210 (2) | 133,570 | දෙපාර්තමේන්තුව විසින් නියමිත දිනයට විදුලි බිල්පත් නොගෙවීම නිසා ප්‍රමාද ගාස්තුවක් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 1645(අ) | - | වාහනය අනතුරට ලක්වූ විට එම අලාභය සිදු වූ දිනය, ස්ථානය, රියදුරුගේ නම, අලාභයේ විස්තරය ආදිය වාහන ලොග් පොත්වල සටහන් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **2006 අංක 10 දරන දේශීය ආදායම් පනත** | | |
| | පනතේ 114 වගන්තිය සහ 2015 ජූලි 06 දිනැති අංක SEC/2015/05 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | | ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමට පත්කර ඇති කමිටු සාමාජිකයන්ට හා දෙපාර්තමේන්තු නිලධාරීන්ට ගෙවනු ලැබූ දීමනාවලින් උපයන විට ගෙවීම් බදු අඩු කර ගෙන නොතිබුණි. |
| **(ඇ)** | **ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව** | | |
| (ඇ) | 2010 ජනවාරි 04 දිනැති අංක NSCC/2/4/3/2/2/13 දරන චක්‍රලේඛය | 6,697,955 | දිරි දීමනා ක්‍රමයෙහි ප්‍රතිලාභවලට හිමිකම් ලබන නිලධාරින් සඳහා අතිකාල දීමනා හෝ වෙනත් කිසිදු දීමනාවක් නොගෙවිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එසේ ගෙවා තිබුණි. |

## 3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දෙපාර්තමේන්තුව විසින් නීතිය බලාත්මක කිරීමේ මධ්‍යස්ථානය, කටාන ප්‍රදේශයේ ඉදිකිරීම සඳහා රු.මිලියන 60 ක ප්‍රතිපාදන සලසා තිබුණද 2016 වර්ෂයේදී එයින් කිසිදු උපයෝජනයක් කර නොතිබුණු අතර අදාළ කාර්ය ආරම්භ කරද නොතිබුණි.

### (ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(i) කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ විවේක කාමරයක් ඉදිකිරීමේ කටයුතු 2016 ජුනි මාසය වනවිට අවසන් කිරීමට සැලැසුම් කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විටත් එහි භෞතික ප්‍රගතිය සියයට 85 ක් වී තිබුණි.

(ii) ගමන් බලපත් සහ වීසා අංශයේ පෝලිම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය 2016 ඔක්තෝබර් මාසය වන විට අවසන් කිරීමට සැලැසුම් කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විටත් එහි භෞතික ප්‍රගතිය සියයට 95 ක් වී තිබුණි.

**3.8** **කාර්යසාධනය**
**---------------**

දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත සඳහන් කර ඇත.

(අ) 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවූ පහත සඳහන් කාර්යයන් වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්මේ ඇතුළත් කර තිබුණි.

| ප්‍රසම්පාදන වර්ගය | ඇස්තමේන්තුගත වියදම |
|---|---|
| | රු. මිලියන |
| - දත්ත මධ්‍යස්ථානය සහ යටිතල පහසුකම් ඇති කිරීම | 14.4 |
| - බත්තරමුල්ල නව ගොඩනැගිල්ල පාර්ටිෂන් කිරීම | 120.0 |
| - පරිගණක ජාල ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම | 10.8 |
| - නව ගොඩනැගිල්ල සඳහා පර්යේෂණ ඒකකයක් පිහිටුවීම | 0.5 |
| - Dash Boards & Queue management (1st to 7th floor branches) for new building at Battaramulla | 12.0 |
| - ටයර් මිලදී ගැනීම හා වාහන අළුත්වැඩියාව | 3.5 |
| - නව ගොඩනැගිල්ලේ ලී බඩු හා අදාළ වැඩ (පරිගණක, ගමන් බලපත්, සංශෝධන සහ ඕළුම් අංශය - 1, 2 මහල් සහ 3,4,5,6,7 මහල් සඳහා) | 90.90 |
| - බත්තරමුල්ල නව ගොඩනැගිල්ල සඳහා CCTV කැමරා පද්ධතිය ජාලගත කිරීම. | 23.14 |
| - ලී බඩු සහ කාර්යාල උපකරණ | 1.2 |
| - නව ගොඩනැගිල්ල සඳහා දුරකථන සම්බන්ධතාවය සහ ලීස් ලයින් | 36.28 |
| - Hardware items for new building at Battaramulla | 60.0 |
| - යන්ත්‍ර පිරියත හා උපකරණ | 4.0 |

(ii) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ හෝ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවූ කටුනායක ගුවන් තොටුපල නිලධාරීන්ගේ පැරණි නේවාසිකාගාර ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා රු. මිලියන 0.3 ක් වැය කර කාර්යය නිම තිබුණි.

(ආ) ගමන් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගමන් බලපත්‍ර භාරගන්නා අවස්ථාවේදීම අඩුපාඩු හඳුනා ගෙන නොතිබුණි. මේ නිසා 2016 සැප්තැම්බර් මාසයෙහි පමණක් අයදුම්පත් භාර ගැනීමේදී සිදුව තිබුණු අඩුපාඩු නිසා ගමන් බලපත්‍ර සකස් කිරීම මාස එකකට වඩා වැඩි කාලයක් පමා වී තිබුණු අවස්ථා 108 ක් නිරීක්ෂණය විය. 2016 නොවැම්බර් 08 දින වන විටත් එම ගමන් බලපත්‍ර සකස් කර නොතිබුණු අවස්ථා 27 ක් පැවැතුණි.

(ii) මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ ගමන් බලපත්‍ර 1,350 ක් අවලංගු කර තිබුණද, ඒ සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන නොතිබූ බැවින් ඒවා අවලංගු කරන ලද දිනයන් තහවුරු කරගත නොහැකිවුණි. අවලංගු කරන ලද ගමන් බලපත්‍රවලින් කොටසක් ප්‍රධාන කාර්යාලය වෙත යැවූ බව සඳහන් කළද එම ගමන් බලපත්‍ර අංකයන් නිවැරදිව හඳුනාගැනීමට නොහැකි විය. ප්‍රාදේශීය කාර්යාලය විසින් 2016 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළදී විවිධ හේතුන් මත ගමන් බලපත්‍ර 248 අවලංගු කර තිබුණි.

(iii) ප්‍රධාන කාර්යාලයෙන් ප්‍රාදේශීය කාර්යාල වෙත හිස් ගමන් බලපත්‍ර නිකුත් කිරීමේදී ඒ පිළිබඳව ලේඛනයක සටහන් කර නොතිබූ අතර ප්‍රධාන කාර්යාලයෙන් ලැබෙන හිස් ගමන් බලපත්‍ර භාරදීමේ ලියවිලිද ගොනුගත කර නොතිබුණි.

(iv) ගමන් බලපත් අයදුම්පත් සඳහා නියමිත ගාස්තුව ගෙවීමෙන් අනතුරුව මුදල් ගෙවන ලද රිසිට්පත් අවලංගු කර ඇති අවස්ථා තිබුණි. එම අවලංගු කරන ලද රිසිට්පත්වල දිනය අවසාන සරප් වාර්තාවේ සඳහන් විය යුතු වුවත්, එසේ සඳහන් කර නොතිබූ අවස්ථා පැවතුණි. දිනය තුළදී නිකුත් කරනු ලබන ආරම්භක රිසිට්පත් අංකය, අවසාන රිසිට්පත් අංකය, මුළු රිසිට්පත් ගණන, අවලංගු කළ රිසිට්පත් විස්තර සටහන් කරනු ලබන Receipt book හි, අවලංගු කරන ලද රිසිට්පත් ගණන පිළිබඳ සඳහන් වුවද, එම රිසිට්පත් මොනවාද යන්න සඳහන් කර නොතිබුණි.

(ඇ) නැව් මඟින් වරායට පැමිණෙන පුද්ගලයන් හට ලංකාවට ගොඩබැසීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා භාවිතා කරනු ලබන පොතෙහි එක් අවසර පත්‍රයක් පිටපත් දෙකකින් සමන්විත වන අතර, එහි මුල් පිටපත නැවෙහි සාමාජිකයාට නිකුත් කරනු ලබන අතර අනු පිටපත කාර්යාල පිටපත ලෙස ගොනුගත කළ යුතුව තිබුණි. කෙසේ වුවද ත්‍රිකුණාමල කාර්යාලයෙහි මෙම අවසරපත්‍ර අනුක්‍රමික අංක පිළිවෙලට නිකුත් කර නොතිබුණි. තවද මෙහෙයුම් අත්පොත ප්‍රකාරව නිකුත් කරනු ලබන මෙම බලපත්‍ර සියල්ල නැව පිටත්වීමේ දී ආපසු ලබාගත යුතු වුවත්, නිකුත් කරනු ලබන සියළුම බලපත්‍රවල මුල් පිටපත් එසේ නිසි පරිදි ආපසු භාරගෙන ගොනුගත කර නොතිබුණි.

(ඈ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය, එනම් මෘදුකාංග හා ආශ්‍රිත දත්ත සහ ප්‍රත්‍යාන්ත පාලන පද්ධතිය, වීසා සැකසීම, ගමන් බලපත්‍ර පද්ධතිය, පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පද්ධතිය ආශ්‍රයෙන් පෞද්ගලික ආයතනයක් සමඟ 2003 ජුනි 16 දින පටන් ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම ප්‍රකාරව Passport, Border, Visa සහ Citizenship පද්ධති සම්බන්ධව දත්ත ආශ්‍රයෙන් ආදායම් වාර්තා ලබාගැනීම සඳහා පෞද්ගලික ආයතනයකට රු.116,954,160 ක්

සේවා ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. එහෙත් පසුගිය වර්ෂ 5ක ආදායම් ගිණුම් පරීක්ෂාවේදී එහි අඩුපාඩු පැවති බව නිරීක්ෂණය විය.

(ඉ) වැඩ තහනම් කළ නිලධාරීන් 03 දෙනෙකුගෙන් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.217,702 ක් අයකරගෙන නොතිබුණි.

**3.9 පාඩු හා හානි**

-----------------

2015 මාර්තු 24 දින රු. 7,400,000 කට ලබා ගන්නා ලද වාහනයක් 2016 ඔක්තෝබර් 27 දින අනතුරට ලක්වී පූර්ණ අලාභයක් සිදුවී තිබුණද එම වටිනාකම රක්ෂණ ආයතනයෙන් අයකර ගෙන නොතිබුණි.

**3.10 අනාර්ථික ගනුදෙනු**

---------------------

ගමන් බලපත්‍ර තැපැල් කිරීම සඳහා මහනුවර ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් 2016 පෙබරවාරි 16 දින සිට බලපත්‍ර අංකයන් ලබා ගැනීම නිසා පෙර පැවති තැපැල් මුද්‍රා යන්ත්‍රයෙහි රු.167,115 ක මුදලක් ඉතිරි වී තිබූ අතර එම මුදල දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.11 විසඳා නොතිබුණු විගණන ඡේද**

----------------------------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද සඳහා පසුවිපරම් කටයුතු නිම නොවී පැවතුණි. විස්තර පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2010 | 6.5 (a) | දෙපාර්තමේන්තුවේ 7.6.7 බී දරන පරිගණක වාර්තා අනුව 2013 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වීසා රහිතව රට තුළ රැඳී සිටි විදේශිකයන්ගේ සංඛ්‍යාව 2,789 ක් වූ අතර, එසේ රැඳී සිටින්නන් වැටලීමට හා අත්අඩංගුවට ගැනීමට කටයුතු කරනු ලබන විමර්ශනවලදී 159 දෙනෙකු පමණක් රටින් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. එය වීසා රහිතව රැඳී සිටින්නන්ගෙන් සියයට 6 ක ප්‍රතිශතයක් පමණක් විය. |
| 2011 | 6.7 | |

**3.12** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 61 | 50 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 398 | 349 | 49 |
| (iii) | ද්විතියික මට්ටම | 439 | 431 | 08 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 139 | 136 | 03 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 10 | 05 | 05 |
| | **එකතුව** | **1,047** | **971** | **76** |